# මහා සභා රැස්වීම් වාර්තාව

# 2022.03.10

## පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2022.03.10 වන දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීම 2022 මාර්තු මස 10 වන දින පෙ.ව.10.00ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු උපසභාපති | - | ඩී.වී.උපාලි මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.ආරියරත්න මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.ඉන්දික මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.පියසේන මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සෙල්වනායගම් රගවන් මැතිතුමා. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා. |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා. |
| 35. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |

පැමිණ සිටි සියලුදෙනාම ආගම සිහි කර, රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපතිතුමා , ගරු විපක්ෂනායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද,ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01. පසුගිය සභා වාර්තාව (2022.02.10) හා විශේෂ මහා සභා වාර්තාව (2022.02.25) සභා සම්මත කිරීම.**

2022.02.10 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව හා 2022.02.25 දින පැවති විශේෂ මහා සභා වාර්තාව කියවූවා සේ සලකා සංශෝධන ඇතොත් ඉදිරිපත් කිරීමටත් ,සංශෝධන නොමැති නම් එම වාර්තාව සභා සම්මත කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ඒ අනුව 2022.02.10 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව හා 2022.02.25 දින පැවති විශේෂ මහා සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමන් විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදනය.**

**03. සභා අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**I. ගරු සභාපති එච්.ඒ. ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා**

**01.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ පරිසර දැක්ම හා මෙහෙවර මහා සභා අනුමැතියට ඉදිරිපත් කරමි.

- පරිසර දැක්ම - තුරුලතා රකිමින් සමෘද්ධිමත් හරිත වර්ණ හෙටක්
- පරිසර මෙහෙවර - ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්වභාවික සම්පත රැක ගනිමින් අනාගත පරපුරට තුරුලතා පිරි හෙටක් ගොඩනැගීම අපගේ මෙහෙවර වන්නී ය.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ පරිසර දැක්ම හා පරිසර මෙහෙවර සඳහා **"පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ"** ලෙස සඳහන් කිරීම වඩාත් සුදුසු බව ය.

අසල් වැසියන්අතර ගැටුම් ඇති වූ අවස්ථා වල දී ගැටුම අවසාන වන්නේ ඉඩමේ මායිමේ පවතිනතුරුලතා ඉවත් කිරීමෙන් අනතුරුව බවත් , තවත් සමහර මිනිසුන් ගස් ආසන්නයේ නිවාස සාදා පසුව ගස් නිවසට අනතුරුදායක බව පවසමින් කපා දමන බවත් , පවතින නීතියත් සමඟ එවැනි අවස්ථා වල දී නිවැසියන්ගේ ආරක්ෂාව සඳහා එවැනි විසඳුම් වලට යා යුතු බවත් , ගසේ උස ප්‍රමාණයත් ගස හා නිවස අතර පවතින දුර ප්‍රමාණයත් සලකා බලා ගස නිවැසියන්ට අනතුරුදායක විය හැකි යැයි සිතා නිලධාරීන් ඉදිරියට කටයුතු කරන බවත් , නිවසටම එම ගස අනතුරුදායකයි යනුවෙන් තීරණය කිරීම ගැටලු සහගත බවත් , තුරුලතා ආරක්ෂා කර ගත යුතු බවත් , ඒ සම්බන්ධව කාරුණික අවධානය යොමුකර නීතිය සංශෝධනය කිරීමට අදාල අංශයන්ට යොමු කළ යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා පවසා සිටින ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා පවසා සිටියේඖෂධ මෙන් ම ඉතා වටිනා ශාක නම් කර පුවරු එල්ලාආරක්ෂා කිරීම සඳහා වැඩපිළිවෙලක් සැකසිය යුතු බව ය.

පරිසර කමිටුව ක්‍රියාත්මක තත්වයට පවත්වා ගෙන යා යුතු බව අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීකේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටින ලදී.

ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පරිසර කමිටුව කිහිප වරක් කැඳවූ නමුත් එහි දී ලබා ගත් තීරණ ක්‍රියාත්මක නොවූ බවත් , කමිටු සාමාජිකයින් කමිටුවට සම්බන්ධ වී ගිය පසු නැවත ඊළඟ කමිටුව සඳහා සම්බන්ධ වන බවත් , කමිටුවක් නම් ක්‍රියාකාරී ලෙසපවත්වා ගෙන යා යුතු බවත් ය.

**තීරණ අංක 01**

- පරිසර දැක්ම - පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ තුරුලතා රකිමින් සමෘද්ධිමත් හරිත වර්ණ හෙටක්
- පරිසර මෙහෙවර - පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ස්වභාවික සම්පත රැක ගනිමින් අනාගත පරපුරට තුරුලතා පිරි හෙටක් ගොඩනැගීම අපගේ මෙහෙවර වන්නී ය.

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ පරිසර දැක්ම හා මෙහෙවර ඉහත පරිදි සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**02.** පහත නම් සඳහන් සේවකයන්ගේ ගිවිසුම්ගත සේවා කාලය අදාළ දිනයේ සිට ඉදිරියට වසරකින් දීර්ඝ කිරීමට යෝජනා කරමි.

| නම | තනතුර | ගිවිසුම අවසන් වන දිනය |
|---|---|---|
| ආර්.එම්.ටී.රත්නාවතී මිය | සෞඛ්‍ය කම්කරු | 2022.04.22 |
| එච්.කාන්තිරත්න මිය | සෞඛ්‍ය කම්කරු | 2022.04.23 |
| ආර්.එස්.කුසුමාවතී මිය | සෞඛ්‍ය කම්කරු | 2022.04.24 |
| කේ.එච්.එල්.විමලරත්න මයා | සෞඛ්‍ය කම්කරු | 2022.05.01 |
| ටී.එම්.සරත් කුමාර මයා | සෞඛ්‍ය කම්කරු | 2022.05.02 |
| ටී.වී.පී.ලක්මාල් මයා | සෞඛ්‍ය කම්කරු | 2022.06.03 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 02**

ඉහත නම් සඳහන් සේවකයන්ගේ ගිවිසුම්ගත සේවා කාලය අදාළ දිනයේ සිට ඉදිරියට වසරකින් දීර්ඝ කිරීම සඳහා ඉදිරිපත් කළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** පරෙවිකුඹුර ඉඩම ( පොළ භූමි ඉඩම ) සම්බන්ධයෙන් 2021.12.31 දින අංක RA 11/2020 දරණ රත්නපුර සිවිල් අභියාචනා මහාධිකරණයේ විභාග වූ නඩුව සඳහා පෙනී සිටීම වෙනුවෙන් නීතිඥ ගාස්තු වශයෙන් රු.90,000.00 ක මුදල නීතිඥ එන්.වික්‍රමසූරිය මහතාට ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>තීරණ අංක 03</u>

පරෙවිකුඹුර ඉඩම ( පොළ භූමි ඉඩම ) සම්බන්ධයෙන් 2021.12.31 දින අංක RA 11/2020 දරණ රත්නපුර සිවිල් අභියාචනා මහාධිකරණයේ විභාග වූ නඩුව සඳහා පෙනී සිටීම වෙනුවෙන් නීතිඥ ගාස්තු වශයෙන් රු.90,000.00 ක මුදල නීතිඥ එන්.වික්‍රමසූරිය මහතාට ගෙවීම සුදුසු බවට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**04.** 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අනවසර ඉදිකිරීම් හඳුනා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් සභාව විසින් අනුගමනය කර නොතිබුනු අතර , මහජන පැමිණිලි හා ක්ෂේත්‍ර පරීක්ෂාව මඟින් අනවසර ඉදිකිරීම් 66ක් පමණක් හඳුනා ගෙන තිබූ අතර , ඉන් 56 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට සභාව අපොහොසත් වී ඇති බව විගණනයෙන් පෙන්වා දී ඇත.මේ සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ විගණනයෙන් දිගින් දිගටම මෙම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා සභාව මඟින් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවට පෙන්වා දෙන බවත් , එහි දී බොහොමයක් අනවසර ඉදිකිරීම් කෙටේතැන්න ප්‍රදේශයේ ඇළ දිගේ සාදා ඇති බවත් , වත්මන වන විට එම ගොඩනැගිලි මහා පරිමාණ ගොඩනැගිලි බවට පත් වී ඇති බවත් , වසර ගණනාවකට පෙර කෝටි ගණන් මුදල් වියදම් කර මිනිසුන් සාදා ඇති මෙම ගොඩනැගිලි ඉවත් කිරීමට ගියහොත් විශාල ගැටලුකාරීතත්වයක් ඇති විය හැකි බවත් ය.තව ද මාර්ග රක්ෂිතය හා ඇළ රක්ෂිතය බොහෝ ලෙස මෙම ගොඩනැගිලි ඉදිකිරීමට පාවිච්චි කර ඇති බවත් , අනවසර ඉදිකිරීම් සම්බන්ධව පනත අනුව අධිකරණයෙහි නඩු පැවරිය හැකි බවත් , මෙම අනවසර ඉදිකිරීම් ඉවත් කළ යුතු බවට අධිකරණයෙන් තීන්දුවක් ලබා දුන්නහොත්එහි දී විශාල අර්බුදයක් ඇති විය හැකි බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමා පවසා සිටියේ මානුෂීයව සලකා බැලුවහොත් එසේ විශාල ගොඩනැගිලි ඉවත් කළ නොහැකි බවත් , ක්ෂේත්‍රයට ගොස් බැලූ විට එය පැහැදිලි වන බවත් , විශාල කාලයක සිට මිනිස්සු විශාල ලෙස ව්‍යාපාර කරගෙන යන බවත් , එනිසා සුදුසු ම විකල්පය වත්මනෙහි පවතින ගොඩනැගිලි මැන තක්සේරු වටිනාකමක් ලබා දී සභාවට එමඟින් ආදායමක් ලබා ගැනීම බවත් , විගණනය සඳහා පිළිතුර එසේ සකස් කර යැවීම සුදුසු බවත්ය.

මෙවැනි ගැටලු සඳහා පරිසර කමිටුවෙන් විසඳුම් ලබා ගත හැකි බවත් , පරිසර කමිටුව පවත්වා ගෙන යාම සුදුසු බවත් ,ගොඩනැගිලි ඉදිකිරීමේ දී අවසර ලබා ගත යුතු බවත් , මේ ආකාරයට කටයුතු කළහොත් අනාගත පරපුරට කිසිවක් ඉතිරි නොවන බවත් , මෙම වර්ෂයේ දී මින් පසු ඉදිකරන මෙවැනි අනවසර ඉදිකිරීම් නැවැත්විය යුතු බවත් අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටින ලදී.

මෙම අනවසර ගොඩනැගිලි වසර ගණනාවක සිට පවතින ඒවා බවත් , නැවත එසේ අනවසර ඉදිකිරීම් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල සීමාව තුල සිදු වේ නම් අනිවාරයෙන් ම කාර්මික නිලධාරී මහතාට යොමු කර වාර්තා ලබා ගෙන අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවත් ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසන ලදී.

පරිසර කමිටුව පවත්වා ගෙන යාම සුදුසු බවට අදහස් දක්වමින් ගරු විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ එම අනවසර ඉදිකිරීම් වසර කිහිපයක සිට පවතින ඒවා බැවින් ගොඩනැගිලි ඉදිකරන මුල් අවස්ථාවේ දී ඒ සම්බන්ධව ක්‍රියාත්මක වී නොමැති බවත් , ජනාකීර්ණ වීමත් සමඟ මෙවැනි ගැටලු පැන නගින බවත් , පරිසරය ආරක්ෂා විය යුතු බවත් , මේ සම්බන්ධව අනවසර ඉදිකිරීම් යන කෝනයෙන් නොබලා විශාල ගොඩනැගිලි වලින් පරිසරයට හානියක් සිදු වේ ද යන්නත් එසේ පරිසරයට බලපෑමක් සිදු වේ නම් ඒ සම්බන්ධව කටයුතු කළ යුතු බවත් , ජලය ගලා ගෙන යාමට ඇති ඇළ මාර්ගයට අවහිරයක් නොවන පරිදි ගොඩනැගිලි පවතී නම් එවිට ගැටලු මතු නොවන බවත් , ප්‍රයෝජනවත් වන බවත් , මෙය විගණනයට පෙන්වා දී සභාවට ආදායමක් ලබා ගැනීමට කටයුතු කළ යුතු බවත් , අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ දීජනයාටවෙනත් ස්ථාන ලබා දීහෝ ක්‍රමවත්ව එය විය යුතු බවත් , මින් පසු ඉදිකරන නව ඉදිකිරීම් වල දී නිසියාකාරව සැලසුම් අනුමත කර ඉදිකිරීම සුදුසු බවත් , අනවසර ඉදිකිරීම් සඳහා නීතිය ක්‍රියාත්මක විය යුතු බවත් ය.

<u>තීරණ අංක 04</u>

2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මහජන පැමිණිලි හා ක්ෂේත්‍ර පරීක්ෂාව මඟින් හඳුනා ගෙන ඇති අනවසර ඉදිකිරීම් 66 න් 56 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට සභාව අපොහොසත් වී ඇති බව විගණනයෙන් පෙන්වා දී ඇතිමුත් බොහෝ කාලයක සිට සාදා නිම කර ඇති එම විශාල ගොඩනැගිලි වල මහා පරිමාණ ලෙස ව්‍යාපාර කටයුතු සිදු කරමින් පවත්වා ගෙන යාම නිසා ගොඩනැගිලි කඩා ඉවත් කිරීම මානුෂීය නොවන බැවින් එම ගොඩනැගිලි මැන තක්සේරු වටිනාකමක් ලබා දී සභාවට ආදායමක් ලබා ගැනීම සුදුසු බවටත් , එම අනවසර ඉදිකිරීම් හේතුවෙන් ස්වාභාවික පරිසරයට හානියක් සිදු වී ඇති නම් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල ආයතන දැනුවත් කිරීම සුදුසු බවටත් , මින් පසු මෙසේ අනවසර ඉදිකිරීමක් සිදු වේ නම් කාර්මික නිලධාරී වාර්තාවක් ලබා ගෙන ඒ අනුව ක්‍රියාත්මක වීම සුදුසු බවටත් ඒකමතිකව සහා සම්මත විය.

**05.** පළාත් පාලන ආයතන බල සීමාව තුළ පිහිටි ජලය බැස යාමට සලස්වා ඇති හෝ ජලය බැස යාමේ අරමුණින් නිර්මාණය කර ඇති හෝ ස්වභාවික සියලු ප්‍රධාන ඇළ මාර්ග , සියලු අතුරු මාර්ග හා සියලු පෝෂිත ඇළ මාර්ගයන්හි මතුපිට පළල අනුරූප වන සේ ඉවුරු දෙකෙහි ම ඉවුරේ මායිමේ සිට දුර ප්‍රමාණයක් රක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් කැමැත්ත ඉල්ලා සිටී.ඒ සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙම ඉල්ලීම කර ඇත්තේ කවු ද යන්න ගරු විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විමසූ පැනයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ලිපිය යොමු කර ඇති බව ය.

වටිනා යෝජනාවක් බවත් , ඇළවල් වල ජලය නොමැති වීම නිසා මිනිසුන් ඒවා හරස් කර නිවාස සාදන බවත් , නමුත් වර්ෂා කාලයේ දී ජලය ගලා ගෙන යාමට නොහැකිව විශාල ගැටලු මතු වන බවත් , එනිසා ඇළ දොළවල් හඳුනා ගෙන රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවත් , රක්ෂිතයක සමහර ස්ථාන වල ගොඩනැගිලි සාදා තිබිය හැකි බැවින් එවන් අවස්ථාවක රක්ෂිත ප්‍රදේශ අලුතෙන් හඳුනා ගෙන තීරණයක් ගැනීම සුදුසු බවටත් අදහස් දක්වමින් ගරු විපක්ෂනායකතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ සමහර බිම් කට්ටි සැලැස්ම වල ඇළ මාර්ග රක්ෂිත වෙන් කර ඇති බවත් , ඒවා ඒ ආකාරයට ම පවත්වා ගත යුතු බවත් , රක්ෂිත වල නව ඉදිකිරීම් සිදු කිරීමට අවස්ථාව ලබා නොදිය යුතු බවත් , අලුතෙන් නම් කරන රක්ෂිත ආරක්ෂා කර ගත යුතු බවත්ය.තව ද දැනට රක්ෂිත ප්‍රදේශ ලෙස නම් කර ඇති ප්‍රදේශයන් නැවත මැනීමේ දී වැඩි වුවහොත් කුමක් සිදු වේ ද යන්නත් එතුමා විමසන ලදී.

ලිපිය සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ **" රක්ෂිත සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය , වාරිමාර්ග දෙපාර්තමේන්තුව , මධ්‍යම පරිසර අධිකාරිය , මහවැලි අධිකාරිය , ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව හා පළාත් පාලන ආයතන විසින් ප්‍රකාශ කර ඇති දුර ප්‍රමාණය මෙම ප්‍රකාශයේ රක්ෂිත ප්‍රමාණයන්ට වැඩි වන අවස්ථාවක එම ආයතන විසින් ප්‍රකාශ කරනු ලබන රක්ෂිත බල පැවැත්වෙනු ඇත."** යන්න ලිපියෙහි සඳහන් වන බව ය.මේ සඳහා සභාවේ අනුමැතිය ලැබුනහොත් ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ දී ඒවා ද සලකා බලා සැලසුම අනුමත කළ හැකි බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

පර්චස් 6ක් නොමැති පුද්ගලයෙකුට සැලසුම් අනුමත නොකිරීම නිසා ඉදිකිරීමක් සිදු කිරීමට නොහැකි බවත් , එනිසා මිනිසුන් අනවසරයෙන් ඉදිකිරීම් සිදු කිරීමට පෙළඹෙන බවත් , පැල්මඩුල්ල ප්‍රදේශයේ පර්චස් 3ක් මිල දී ගැනීමට රු .ලක්ෂ 60ක් සමහ මුද්දර ගාස්තු ගෙවිය යුතු බවත් , සැලසුම් අනුමත නොකිරීම නිසා මිනිසුන් එවැනි අවස්ථා වල දී අපහසුතාවයට පත් වන බවත් , ඒවාට වැඩ පිළිවෙලක් අවශ්‍ය බවත් , ඒ සඳහා තාවකාලික බලපත්‍රයක් හෝ ලබා දිය යුතු බවත් ගරු උප සභාපතිතුමා පවසන ලදී.

ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේනාගරික සංවර්ධන අධිකාරියෙන් ලංකාවටමඑමනීතිය පනවා ඇති බව ය.

<u>**තීරණ අංක 05**</u>

වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන අමාත්‍යාංශය මඟින් 2019 අංක 11 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධිත) පනතේ 4 (අ) 1 වගන්තිය යටතේ ඇළ රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම යටතේ පළාත් පාලන ආයතන බල සීමාව තුළ පිහිටි ජලය බැස යාමට සලස්වා ඇති හෝ ජලය බැස යාමේ අරමුණින් නිර්මාණය කර ඇති හෝ ස්වභාවික සියලු ප්‍රධාන ඇළ මාර්ග , සියලු අතුරු මාර්ග හා සියලු පෝෂිත ඇළ මාර්ගයන්හි මතුපිට පළල අනුරූප වන සේ ඉවුරු දෙකෙහි ම ඉවුරේ මායිමේ සිට දුර ප්‍රමාණයක් රක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව කැමැත්ත ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**06.** බුලත්වත්ත සමඟි අවමංගල්‍යාධාර සමිතියේ බහුකාර්යය ගොඩනැගිල්ලේ පළමු අදියර සකස් කිරීම හා සම්බන්ධ රු.573,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුව අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 06**</u>

බුලත්වත්ත සමඟි අවමංගල්‍යාධාර සමිතියේ බහුකාර්යය ගොඩනැගිල්ලේ පළමු අදියර සකස් කිරීම හා සම්බන්ධ රු.573,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුව අනුමත කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** බෝගොඩ අරඹ පහළ දේවාලයගම ප්‍රධාන මාර්ගයේ බෝක්කුව අසල රැඳවුම් බැම්ම ඉදිකිරීම සම්බන්ධ රු.418,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 07**</u>

බෝගොඩ අරඹ පහළ දේවාලයගම ප්‍රධාන මාර්ගයේ බෝක්කුව අසල රැඳවුම් බැම්ම ඉදිකිරීම සම්බන්ධ රු.418,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** යහලබැදිවත්ත , කෙටේතැන්න අංක 05 දරණ දෙමළ විද්‍යාලය පිටුපසින් දිගින් මීටර් 150ක් දුරට වැටී ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීමටත් , මෙම මාර්ගය වැටී ඇති හොරගස්ඕවිට පාරෙන් (සිරිපාල කඩය අසලින්) නීලගම පාරට වැටී ඇති අතුරු මාර්ගය මීටර් 175 ක් පමණ කොන්ක්‍රීට් කිරීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 08**</u>

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, යහලබැඳිවත්ත , කෙටේතැන්න අංක 05 දරණ දෙමළ විද්‍යාලය පිටුපසින් දිගින් මීටර් 150ක් දුරට වැටී ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීමටත් , මෙම මාර්ගය වැටී ඇති හොරගස්ඕවිට පාරෙන් (සිරිපාල කඩය අසලින්) නීලගම පාරට වැටී ඇති අතුරු මාර්ගය මීටර් 175 ක් පමණ කොන්ක්‍රීට් කිරීමටත් ඉදිරිපත් වූ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

**09.** බැරැන්ඩුව හුනුකොටුව මාර්ගය ඉතා අබලන් තත්වයේ ඇති බැවින් අඩි 300 ක් පමණ කොන්ක්‍රීට් අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 09</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, බැරැන්ඩුව හුනුකොටුව මාර්ගය ඉතා අබලන් තත්වයේ ඇති බැවින් අඩි 300 ක් පමණ කොන්ක්‍රීට් අතුරා මාර්ගය සංවර්ධනය කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10.** නාරංගොඩ කිතුල්වත්ත පංසල මාර්ගය සංවර්ධනය කිරීම.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 10</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, නාරංගොඩ කිතුල්වත්ත පංසල මාර්ගය සංවර්ධනය කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**11.** නාරංගොඩ 19 කොටස අක්කර 15 මාර්ගය සංවර්ධනය කිරීම.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 11</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, නාරංගොඩ 19 කොටස අක්කර 15 මාර්ගය සංවර්ධනය කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**12.** බැරැන්ඩුව කාමර 30 මාර්ගය කොන්ක්‍රීට් කිරීම.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 12</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, බැරැන්ඩුව කාමර 30 මාර්ගය කොන්ක්‍රීට් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**13.** පහත නම් සඳහන් අඩු ආදායම්ලාභී අය හට වැසිකිලි ආධාර ලබා දීමට යෝජනා කරමි.

- ඩී.ඩබ්.සිරිවර්ධන , බැරැන්ඩුව , පැල්මඩුල්ල.
- පී.ඒ.සුමනසේකර , නො.06 , නාරංගොඩ ,පැල්මඩුල්ල.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 13</u>**

ස්ථාන පරීක්ෂකගේ හා අවශ්‍ය අයගේ නිර්දේශයන් සහිතව ඉහත නම් සඳහන් අඩු ආදායම්ලාභී අයහට වැසිකිලි ආධාර ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**II.** **<u>ගරු උප සභාපතිඩී.වී.උපාලි මැතිතුමාගේ යෝජනා.</u>**

**01.**කනත්තේ ගෙදරවත්ත පාර සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ රු.500,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුව අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ ගිවිසුම් අත්සන් කර වැඩ ආරම්භ කිරීමට සූදානම් වන අවස්ථාවේ සිමෙන්ති වල මිල ඉහළ යාම නිසා ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට සිදු වූ බවත් , මෙම සංවර්ධන කාර්යය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු බවත් ය.

**<u>තීරණ අංක 14</u>**

කනත්තේ ගෙදරවත්ත පාර සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ රු.500,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුව අනුමත කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**III.** **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමාගේ යෝජනා.**

**01.** ඉහළ හකමුව පදිංචි අඩු ආදායම්ලාභී වී.එම්.සෝමාවතී යන අයට වැසිකිලි ආධාර ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උපසභාපති ඩී.වී.උපාලිමැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා පවසා සිටියේ මෙම අසරණ පවුල සඳහා අවධානය යොමු කර කඩිනමින් වැසිකිළි ආධාර ලබා දීමට කටයුතු කිරීමසුදුසු බව ය.

**තීරණ අංක 15**

ස්ථාන පරීක්ෂකගේ හා අවශ්‍ය අයගේ නිර්දේශයන් සහිතව ඉහළ හකමුව පදිංචි අඩු ආදායම්ලාභී වී.එම්.සෝමාවතී යන අයට වැසිකිලි ආධාර ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**IV.** **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමාගේ යෝජනා.**

**01.** ඊරියන්දළුව ප්‍රධාන මාර්ගය පසුගිය වර්ෂාවට දැඩි ලෙස අබලන් වී ඇති බැවින් එයට තාර දමා සකස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමා පවසා සිටියේ මාතෘ සායන ඒකකය එම ප්‍රදේශයේ පැවතීම නිසා යාමට අපහසු එම මාර්ගය තාර දමා පිළිසකර කිරීම සුදුසු බව ය.

**තීරණ අංක 16**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, ඊරියන්දළුව ප්‍රධාන මාර්ගය තාර දමා සකස් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**V.** **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමාගේ යෝජනා.**

**01.** ගල්ලින්න ග්‍රාම නිලධාරී වසමේ අවිනි හෝටලය අසලින් ගල්ලින්න ගම දෙසට දිවෙන මාර්ගයේ පවුල් සෞඛ්‍ය සේවිකා සිසිල්ඩා මහත්මියගේ නිවස අසල සිට හෙට්ටිගේ සරත් රණසිංහ නිවෙස දෙසට දිවෙන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සකස් කිරීමටඅවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 17**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, ගල්ලින්න ග්‍රාම නිලධාරී වසමේ අවිනි හෝටලය අසලින් ගල්ලින්න ගම දෙසට දිවෙන මාර්ගයේ පවුල් සෞඛ්‍ය සේවිකා සිසිල්ඩා මහත්මියගේ නිවස අසල සිට හෙට්ටිගේ සරත් රණසිංහ නිවෙස දෙසට දිවෙන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සකස් කිරීමටඅවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**හදිසි යෝජනා.**

**ගරු සභාපති එච්.ඒ. ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ හදිසි යෝජනා.**

**01.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ට්‍රැක්ටර් රථ , ගලි බවුසරය , ජල බවුසරය ක්‍රියා කරවීමට ප්‍රමාණවත් රියදුරන් නොමැති වීම හේතුවෙන් නිසි ලෙස කසළ කළමනාකරණ කටයුතු ඉටු කිරීම ගැටළුවක් වී ඇති අතර ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම් අනුව කාර්යක්ෂම සේවාවක් ලබා දීමට නොහැකි වී ඇත.එබැවින් ගිවිසුම් මත හෝ කුලී පදනම යටතේ ට්‍රැක්ටර් රථ , ගලි බවුසරය , ජල බවුසරය ක්‍රියා කරවීමේ හැකියාවක් ඇති රියදුරන් 03 කු පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව වෙත ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ඩී.වී.උපාලිමැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ට්‍රැක්ටරයක හා ගලි බවුසරයෙහි රාජකාරී කටයුතු කළ සේවකයා විදේශ රටක සේවය සඳහා ගොස් ඇති බවත් , තවත් රියදුරෙක් සේවයට වාර්තා නොකරන බවත් , එනිසා දෛනික රාජකාරී කටයුතු වල දී ගැටලු පැන නැගී ඇති බවත් , පළාත් පාලන කොමසාරිස්තුමා දැනුවත් කර ගිවිසුම් මත හෝ කුලී පදනම යටතේ ට්‍රැක්ටර් රියදුරන් තිදෙනෙකු ලබා ගැනීමේ අවශ්‍යතාව පවතින බවත් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසන ලදී.තව ද මේ සඳහා විශ්‍රාම ගිය රියදුරු රාජේන්ද්‍රන් ඉල්ලීමක් කර ඇති බවත් , ඔහු රාජකාරී කටයුතු නිවැරදිව සිදු කළ බවත් , ඔහු විශ්‍රාම ගිය පුද්ගලයෙක් නිසා එහි ගැටලුවක් ඇති බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු විපක්ෂනායකතුමා පවසා සිටියේ රියදුරන් බඳවා ගැනීමේ දී ස්ථිර කළ හැකි සුදුසුකම් ඇති අය බඳවා ගත යුතු බවත් , අත්‍යවශ්‍යතාව මත තාවකාලික පදනම මත දැනට සේවකයින් බඳවා ගත්ත ද පසුව ස්ථිර කළ හැකි පුද්ගලයෙක් බඳවා ගැනීම වඩාත් සුදුසු බව ය.

ඒ සම්බන්ධව අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ අත්‍යවශ්‍ය සේවාවක් බැවින් මෙම යෝජනාව වඩාත් සුදුසු බවත් , කඩිනමින් ඒ සඳහා කටයුතු කළ යුතු බවත් , කසළ එකතු කිරීම සඳහා ට්‍රැක්ටරයෙහි වැඩ කිරීමට සේවකයින් ඉල්ලුම් කිරීම අඩු බවත් , අත්‍යවශ්‍ය කාරණාවක් නිසා සභාවට තීන්දුවක් ගෙන ක්‍රියාත්මක විය හැකි බවත් ය.

<u>**තීරණ අංක 18**</u>

ගිවිසුම් මත හෝ කුලී පදනම යටතේ ට්‍රැක්ටර් රථ , ගලි බවුසරය , ජල බවුසරය ක්‍රියා කරවීමේ හැකියාවක් ඇති රියදුරන් 03 කු පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව වෙත ලබා ගැනීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**02.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයිති මාරපන කහවිටිගොඩ සුසාන භූමියේ ඇති කොස් ගස් හතරෙහි අතු කඩා වැටීම නිසා මේ වන විට එක් පුද්ගලයෙකු රෝහල් ගත කර ඇති බවත් , මෙම ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ලේ මාතෘ සහ ළමා සායන පවත්වන බැවින් කුඩා දරුවන්ගේ ආරක්ෂාව සඳහාත් , එම ගොඩනැගිලි වල වහල ආරක්ෂා කර ගැනීම සඳහාත් , මාර්ගයේ ගමන් කරන මහජනතාවගේ ආරක්ෂාව සඳහාත් මෙම කොස් ගස් හතර කපා ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ඩී.වී.උපාලිමැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම ගස් මිල ගණන් කැඳවා සහා අරමුදලින් වියදම් කර කපා , එම ස්ථානයේ ම වෙන්දේසි කර එම වෙන්දේසි මුදල් සභා අරමුදලට දැමීම සුදුසු බව ය.

<u>**තීරණ අංක 19**</u>

ග්‍රාම නිලධාරී වාර්තාව හා කාර්මික නිලධාරී වාර්තාව සලකා බලා මහජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයිති මාරපන කහවිටිගොඩ සුසාන භූමියේ ඇති කොස් ගස් හතර සභා අරමුදලින් කපා , එම ස්ථානයේ ම වෙන්දේසි කර , එම මුදල් සභා අරමුදලට බැර කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමාගේ හදිසි යෝජනා.**</u>

**01.** පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙනවක පාතකඩ ග්‍රාම නිලධාරී වසමේ දෙනවක පාකතඩ වැඩිහිටි සමිතියේ සංවත්සරික උත්සවයේ වැඩිහිටියන් සඳහා තිළිණ ප්‍රදානය වෙනුවෙන් රු.5,000.00 ක මූල්‍යාම අනුග්‍රහයක් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 20**</u>

අවශ්‍ය අනුමැතිය ලබා ගෙන , පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙනවක පාතකඩ ග්‍රාම නිලධාරී වසමේ දෙනවක පාකතඩ වැඩිහිටි සමිතියේ සංවත්සරික උත්සවයේ වැඩිහිටියන් සඳහා තිළිණ ප්‍රදානය වෙනුවෙන් රු.5,000.00 ක මූල්‍යාම අනුග්‍රහයක් ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමියගේ හදිසි යෝජනා.**</u>

**01.** දොඹගස්වින්න වරාගොඩ මාර්ගයේ ප්‍රධාන මාර්ගයෙහි බෝක්කුව හා බැම්ම කඩා වැටී ඇති නිසා එය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 21**</u>

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර , දොඹගස්වින්න වරාගොඩ මාර්ගයේ ප්‍රධාන මාර්ගයෙහි බෝක්කුව හා බැම්ම කඩා වැටී ඇති නිසා එය සංවර්ධනය කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමාගේ හදිසි යෝජනා.**</u>

**01.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීවරුන් සඳහා උත්සව අත්තිකාරම් ලෙස රු.10,000.00 බැගින් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.රගවන් මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 22**</u>

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීවරුන් සඳහා උත්සව අත්තිකාරම් ලෙස රු.10,000.00 බැගින් ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**06. කාරක සභා වාර්තා සලකා බැලීම - 2022-02-10 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම.**

2022-02-10 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.ආරියරත්න මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**07. 2022-02-01 සිට 2022-02-28 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සලකා බැලීම.**

2022-02-01 සිට 2022-02-28 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව , ලැබීම් හාවියදම් පිළිබඳ මාසික ප්‍රකාශ , එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.හිරන්ති චතුරංගනී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**08. වෙනත් කරුණු**

- **සභාව දැනුවත් කිරීමේ නිවේදන හා අදහස් දැක්වීම්**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා.</u>

මහින්ද විද්‍යාලය ඉදිරිපිට ඇති කොට්ටා ගස කපා ඉවත් කිරීම සම්බන්ධයෝජනාව සම්බන්ධයෙන් විමසා සිටින ලදී.

ඒ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ එම ගස සමන් දේවාලයට අයිති බැවින් දින 14ක් ඇතුලත කපා ඉවත් කරන ලෙස ලිපියක් යොමු කර ඇති බව ය.

- **පසුගිය සභාවේ ලබාගත් තීරණ සම්බන්ධයෙන් ප්‍රගතිය සාකච්ඡා කිරීම.**

ගරු විපක්ෂනායකතුමා පරෙවි කුඹුර ඉඩම සම්බන්ධව ප්‍රගතිය විමසන ලදී.

පරෙවි කුඹුර ඉඩම සම්බන්ධයෙන් RA/11/2020 අංක දරණ නඩුව 2022.02.10 දින රත්නපුර සිවිල් අභියාචනා මහාධිකරණයේ දී විභාගයට ගත් බවත් , සභාව වෙනුවෙන් නීතිඥ නන්දසේන රත්නපාල මහතා පෙනී සිටි බවත් , පැල්මඩුල්ල දිසා අධිකරණයේ විභාග වූ නඩුවට අප සභාව පාර්ශවකරුවෙකු ලෙස සම්බන්ධ කර ගනිමින් ඉදිරියට පවත්වා ගෙන යාමට මහාධිකරණයේ තීන්දු වූ බවත් , අවසන් නඩු තීන්දුවේ පිටපතක් සභාවට ලබා දෙන බවට නීතිඥ මහතා පැවසූ බවත් ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසන ලදී.

- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වයෙන් හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමාහට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- **මීළඟ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම.**

මහා සභාව 2022 අප්‍රේල් 07 වන දින පැවැත්වීමට තීරණය විය.

- **සභාපතිතුමාගේ ස්තුති කථාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු උප සභාපති තුමන්, විපක්ෂ නායක තුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාටත් හා මන්ත්‍රී තුමියන්ලාටත් , ජනමාධ්‍යවේදී මහතුන්ට ද , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමා ස්තුති කථාව අවසන් කරන ලදී.

**පෙ.ව. 11.00 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.**

වාර්තා ගත කළේ

2022-03-15 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ දීය.

ලේකම්
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා ..................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ......................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2022-04-07 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව